# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2461/40 - 2025 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2025.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2025

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2025 නොවැම්බර් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයේ 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හෝ ගෙවිය යුතු වන අවස්ථාවක නම්, එකී උපලේඛනයේ 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව ආනයන තීරු ගාස්තු නියම කර අයකළ යුතු බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 7336— 428 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| සං. ව. ශීර්ෂය | සංයෝජිත වර්ගීකරණය සංකේතාංක | | විස්තරය | තීරු බදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **71.03** | | | **වැඩ දැමූ හෝ නොදැමූ, වර්ග කළා වූ හෝ නොකළා වූ, නමුත් අමුණා නැති සවි නොකළා වූ හෝ නොබැඳි අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ-අනගි මැණික් ; ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා තාවකාලික සවි කළා වූ, වර්ග නොකළ, අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ-අනගි මැණික් වර්ග.** | | | |
| | | - | වැඩ නොදැමූ හෝ ඉරීම පමණක් කළා වූ හෝ රළු ලෙස හැඩ ගැන් වූ | | | |
| | 7103.10.10 | --- | අනගි මැණික් ගල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SG) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7103.10.20 | --- | අර්ධ අනගි මැණික් ගල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SG) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

EOG 11 - 0063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.